පේරාදෙණිය විශ්වවිද්‍යාලය
**UNIVERSITY OF PERADENIYA**

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016-2017 (අප්‍රේල් 2017)
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2016-2017(April 2017)

## ප්‍රායෝගික ව්‍යාකරණය සහ සිංහල භාෂා මුහුණුවර
## (Practical Grammar and Aspects of the Sinhala Language)
**SINE ( 101 )**
**කාලය පැය තුනයි (03)**

එක් කොටසකින් ප්‍රශ්න **දෙකක්වත් (02)** ඇතුළත්වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.
මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව (08) අටකි.

---

### I කොටස

1. භාෂකයාගේ සමාජ තත්වය භාෂා භාවිතය තුළින් ප්‍රතීයමාන වන ආකාරය සමාලෝචනය කරන්න.

2. ප්‍රදේශයෙන් ප්‍රදේශයට භාෂාමය වෙනස්කම් පවතින ආකාරය උපභාෂා සංකල්පය ඇසුරින් සාකච්ඡා කරන්න.

3. ෆර්ගියුසන් දැක්වූ භාෂා ද්විරූපතාවෙහි ස්වභාවය, සිංහල භාෂා ද්විරූපතාවේදී වෙනස් වන ආකාරය සනිදර්ශනව සාකච්ඡා කරන්න.

4. භාෂාමය ආචරණ සමාජ කාර්යක් වන ආකාරය පැහැදිලි කරන්න.

### II කොටස

5. පහත දැක්වෙන ප්‍රකාශයන්හි අක්ෂර වින්‍යාසයේ සදොස් තැන් ඇතොත් නිදොස් කර ලියන්න.

    i. අළුතින් හඳුන්වා දුන් පරිඝනක පාඨමාලාව සඳහා අදල අයදුම්පත් කොට්ටාශ කාර්යාලයෙන් ලබා ගත යුතුය.
    ii. න්‍යාස ප්‍රධානෝත්සවය සඳහා පැමිනි ප්‍රධාන අමුත්තා හෙල සංස්කෘතියේ බාරතීය ආභාෂය පිලිබඳ දේෂනයක් කලේය.
    iii. දලදා පෙරහැර සමයේ මහනුවර නගරය සැනකෙලි සිරියක් උසුළයි.
    iv. සිංහළයෝ ලක්දිව විශිෂ්ඨ ශිෂ්ඨාචාරයක් ගොඩ නැගුහ.
    v. උත්සව සභාවේ වැඩ පිලිවෙල පිලියෙල කර තිබූ අයුරු නෙගෙලපේ යැයි බොහෝ දෙනෙක් කීහ.
    vi. කලුගල් තලන්නන්ට පෙනහළු රෝග වැළදීමේ ප්‍රවනතාවක් ඇත.

6. "ශාස්ත්‍රීය ලේඛනයක භාෂාව ව්‍යාකරණයට අනුගතව පැවතිය යුතුය." මෙම අදහස සමාලෝචනය කරන්න.

7. සිංහලයේ පද බෙදීම සම්බන්ධව **සිංහල ලේඛන රීතියේ** විධිවිධානවලට අනුව පහත සඳහන් ඡේදයේ පද බෙදීම සිදු කර දක්වන්න.

මනුෂ්‍යයා කථා කරන්නට පුරුදු වූයේ කෙසේ ද? ලෝකයේ හැම දෙනෙකු ම එක් භාෂාවක් කථා නො කරන්නේ මන් ද? වචන වලින් දැක්වෙන අදහස් හා ඒවායින් හැඳින්වෙන වස්තූන් අතර ඇති සම්බන්ධය කුමක් ද? යනාදි වශයෙන් භාෂාව පිළිබඳ ව මිනිස් සිතට නැඟෙන නොයෙකුත් ප්‍රශ්න නිරාකරණය කිරීමට පුරාතන මනුෂ්‍යයන් උත්සාහ කළේ යම් දවසක ද, වාග් විද්‍යාවේ ආරම්භයත් එ ද ම විය යුතු ය යනු භාෂා තත්වඥයන් ගේ මතය යි. මේ අනුව වාග් විද්‍යාවේ ආරම්භය ඈත අතීතය කරා ගමන් කරයි. මිනිස් මනසට විෂය නො වූ අඳුරු අතීතයේ සැඟ වී ගිය ප්‍රභවයන් ඇති හැම දෙයක් ගැන ම යම් කිසි නිගමනයකට බැසීමේ දී පුරාතන චින්තකයෝ ආගමික විශ්වාසය, අනුමාන ඥානය හා තර්කන බුද්ධිය මත පිහිටා අදහස් ප්‍රකාශ කළහ. භාෂාව සම්බන්ධ ප්‍රශ්න වල දී ද ඔවුන් ගත්තේ ඒ මග ම ය. භාෂාවේ ප්‍රභවය පිළිබඳ ව පවත්නා නිර්මාණ වාදි මත සියල්ල ම එසේ ප්‍රකාශ කළ ඒවා ය. (විශේෂයෙන් ම ආගමික විශ්වාස මත ඇති කර ගත් නිගමන ය.) භාෂාවේ විකාසනය, ව්‍යාප්තිය හා විවිධත්වය ගැන ඇති මත බොහොමයක් ගොඩ නගා ඇත්තේ ද ඉහත සඳහන් පරිදි ම ය. විද්‍යානුකූල පර්යේෂණයන් ගෙන් තොර ව හුදු විශ්වාසය මත ගොඩ නගන ලද පුරාතන වාග් විද්‍යාවේ මූලික අවස්ථාවට විද්‍යාවක් වශයෙන් ලැබෙන්නේ ඉතා පහත් තැනකි.

8. පහත සඳහන් වැකිවල සදොස් තැන් ඇතොත්,
   (අ) ඒ කවරේදැයි හේතු දක්වමින් පැහැදිලි කරන්න.
   (ආ) සදොස් තැන් නිදොස් කොට නැවත වාක්‍ය ලියා දක්වන්න.

i විදුහල්පති තුමා උත්සව සභාවේ ප්‍රධාන දේශනය පැවැත්වූහ.
ii. කාන්තාවෝ රාත්‍රී කාලයේ තනිව ගමන් නොයා යුතුය.
iii. බල්ලන්ට දිනකට වතාවක්ද, බළලුන්ට දිනකට දෙවතාවක්ද ආහාර දෙනු ලැබෙත්.
iv. තාත්තාත් අම්මාත් මාත් එකම වාහනයේ ගමන් කළෙමි.
v. කොටියෝ ගැවසෙති'යි බියෙන් ගොවියන් කුඹුරුවලට නොයති.
vi. පාක්ෂිකයෝ හඬා වැලපෙද්දී ජනාධිපතිතුමා දැයෙන් සමු ගත්හ.
vii. ඔහු විසින් හරකාද එළුවාද මරයි.
viii. පක්ෂ නායකයා නොහොත් පාක්ෂිකයෝ එයට විරුද්ධ විය.
ix. අපි උත්සාහ කරමු නම් ජය ලබන්නෝ වෙති.
x. කාන්තාවන් තුමු ගස් වවයි.

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගිනි.)